UNEP
unicef
UNESCO
United Nations Educational, Scientific and Cultural Organization
UNESCO Associated Schools
TUNZA
Multilateral Fund for the Implementation of the Montreal Protocol
SCOUTS Creating a Better World
National Ozone Unit
Ministry of Mahaweli Development Environment

# පුංචි යාළු ඕසී ඕසෝන්

## අපේ ලෝකයේ ආරක්ෂකයා



පුංචි යාළු ඕසී ඕසෝන්ගේ දූපත් සවාරිය

# පුංචි යාළු ඔසී ඕසෝන්

## අපේ ලෝකයේ ආරක්ෂකයා

LIBRARY
MINISTRY OF ENVIRONMENT

ACKNOWLEDGEMENTS
THIS CARTOON BOOKLET WAS DEVELOPED BY THE OZONACTION PROGRAMME OF THE DIVISION OF TECHNOLOGY, INDUSTRY AND ECONOMICS OF THE UNITED NATIONS ENVIRONMENT PROGRAMME (UNEP/DTIE) UNDER THE MULTILATERAL FUND OF THE MONTREAL PROTOCOL.




THE OZZY OZONE CHARACTER IS A REGISTERED TRADEMARK OF THE GOVERNMENT OF BARBADOS. UNEP WOULD LIKE TO THANK THE GOVERNMENT OF BARBADOS FOR ITS PERMISSION TO USE THIS CHARACTER.

ISBN: 978-92-807-2912-2

THIS PUBLICATION IS LINKED TO UNEP'S TUNZA STRATEGY FOR CHILDREN AND YOUTH.

**සිංහල අනුවාදය**

උපදේශනය
**උදය ආර්. සෙනෙවිරත්න**
ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
**ආර්. ඒ. ආර්. ආර්. රූපසිංහ**
අතිරේක ලේකම් (පාලන හා ප්‍රවර්ධන)

ප්‍රධාන සංස්කාරක
**ජී. එම්. ජේ. කේ. ගුණවර්ධන**
අධ්‍යක්ෂ
ජාතික ඕසෝන් ඒකකය

අනුවාදක
**නිරෝෂි දොඹගහගේ**

මුද්‍රණය
**ජාතික ඕසෝන් ඒකකය**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**
"සම්පත්පාය" අංක. 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
දුරකතන: 0112 883 417
විද්‍යුත් ලිපිනය: ozone@noulanka.lk
වෙබ් අඩවිය: www.noulanka.lk

## නිර්වචන

**වායුගෝලය** - වායූන් සහ අංශූන්ගෙන් සමන්විත පෘථිවිය වටා පිහිටි ස්ථරයකි.

**කාබන්ඩයොක්සයිඩ් ($CO_2$)** - වායුගෝලයේ පවතින අවර්ණ, ගන්ධයක් නොමැති, දහනය නොවන වායුවකි. කාබන් සහ කාබන් සංයෝජන (පොසිල ඉන්ධන, කාබනික ද්‍රව්‍ය) දහනය මගින්ද, සත්ව සහ ශාක තුළ සියුම්ව සිදුවන දහන ක්‍රියාවලියක් වන ආශ්වාස ප්‍රශ්වාස මගින්ද පසෙහි ඇති කාබනික ද්‍රව්‍ය ඔක්සීකරණය මගින් ද මෙය නිපදවේ.

**ක්ලෝරෝෆ්ලෝරෝකාබන් (CFCs)** - මිනිසා විසින් නිපදවන ලද ඕසෝන් ස්ථරයට හානිකර රසායනික පවුලකි. මේවා මොන්ට්‍රියල් සන්ධායනය විසින් පාලනය කරනු ලබයි. උදා:- CFC 12 ( R 12 ලෙසද හඳුන්වයි)

**හයිඩ්‍රොෆ්ලෝරොකාබන් (HFCs)**- හැලජනීකෘත හයිඩ්‍රොකාබන් පවුලටම අයත් ඕසෝන් ප්‍රහීනකාරකයන් නොවන එහෙත් අධික ගෝලීය උණුසුම් ප්‍රභවයකින් යුක්ත රසායනික කාණ්ඩයකි.

**කොරල්පර** - කොරල් බුහුබාවන් ලෙසින්ද හඳුන්වන කොරල් ජීවීන්ගේ බාහිර සැකිල්ලෙන් නිර්මිත පද්ධතියකි. මෙම ජීවීන් සාමුහිකව වර්ධනය වන විට එය කොරල් කොලණියක් ලෙස හැඳින්වේ.

**පොසිල ඉන්ධන** - පෘථිවි අභ්‍යන්තරයේ දැඩි උණුසුම් කලාපයේ අධික ලෙස කාබන් සහ හයිඩ්‍රජන් සහිත දීර්ඝ කාලයක් සංරක්ෂිතව පැවැති කාබනික ද්‍රවයන්ගෙන් ලබා ගන්නා ඉන්ධන

**හයිඩ්‍රොක්ලෝරොෆ්ලෝරොකාබන් (HCFC)** - CFC වලට වඩා ඉතා අඩු ඕසෝන් ප්‍රහීනකාරක විභයකින් යුත් රසායනිකයන් වේ. මොන්ට්‍රියල් සන්ධානයේ පාලනයට යටත් රසායනිකයන්ට විකල්ප ලෙස හඳුන්වාදුන් නමුත් මේවාද ක්‍රමයෙන් භාවිතයෙන් තුරන් කිරීම අරඹා ඇත. සමහර HCFC වර්ග අධික ගෝලීය උණුසුම් විභයකින් යුක්තය. උදා:- HCFC (R 22 ලෙසද හැඳින්වේ)

**ගෝලීය උණුසුම** - පෘථිවිය ආසන්න වායුගෝලයේ සහ සමුද්‍රයේ නිරීක්ෂිත සාමාන්‍ය උෂ්ණත්වයේ අගය ඉහල යාම.

**හරිතාගාර වායු** - වායුගෝලය තුළ රඳවා ගැනීම නිසා පොළොව උණුසුම් කරනු ලබන වායූන්ය. මේවා ගෝලීය උණුසුම කෙරෙහි බලපාන අතර, සමහර හරිතාගාර වායු ස්වභාවිකව නිපදවේ. ඒ අතර සමහර වායූන් මානව ක්‍රියාකාරකම්වල ප්‍රථිපලයක් ලෙස පරිසරයට මුදා හැරේ. කාබන්ඩයොක්සයිඩ්, මීතේන්, CFC හරිතාගාර වායු කිහිපයකි.

**කියතෝ සන්ධානය** - එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියකි. එමගින් දේශගුණික විපර්යාසයන්ට එරෙහිව සටන් කරන අතර විශේෂයෙන්ම දුප්පත් රාජ්‍යයන්හි වෙසෙන ජනතාවට දේශගුණික විපර්යාසයන්ගෙන් ඇතිවන අනිවාර්ය බලපෑම්වලට මුහුණ දීමට සහායවෙයි.

**මොන්ට්‍රියල් සන්ධානය** - එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ගිවිසුමකි. ස්ථර ගෝලයේ පිහිටි ඕසෝන් ස්ථරය සුරැකීම සිදුකරයි.

**ඕසෝන්** - ඔක්සිජන් පරමාණු තුනකින් සැදුණු අණුවකි. ස්ථර ගෝලයේ පිහිටි ඕසෝන් හිතකර ඕසෝන් ලෙස සලකනු ලබන අතර, පොළොව මට්ටමේ ඕසෝන් අහිතකර ඕසෝන් ලෙස පිළිගැනේ.

**ඕසෝන් විනාශය** - CFC වැනි රසායනිකයන් ස්ථර ගෝලය තුළ බිඳීයෑම නිසා ඕසෝන් ස්ථරයට සිදුවන විනාශය

**ඕසෝන් ප්‍රහීනකාරක ද්‍රව්‍ය (ODSs)** - ස්ථර ගෝලයේ පිහිටි ඕසෝන් විනාශයට දායකවන CFC, HCFC මෙතිල් බ්‍රෝමයිඩ් වැනි රසායනික

**පාරජම්බුල කිරණ (UV Rays)**- පියවි ඇසට නොපෙනෙන බොහෝ ජීවීන්ට අහිතකර ශක්ති කිරණ විශේෂයකි.




**United Nations Environment Programme**
**Division of Technology, Industry and Economics**

15 rue de Milan
75441 Paris Cedex 09
FRANCE

Tel.: +33 144 37 14 50
Fax: +33 144 37 14 74
E mail: ozzy@unep.fr
Web: www.ozzyozone.org

© United Nations Environment Programme 2008

This publication may be reproduced in whole or in part and in any form for educational or non-profit purposes without special permission from the copyright holder, provided acknowledgement of the source is made. UNEP would appreciate receiving a copy of any publication that uses this publication as a source.

No use of this publication may be for resale or for any other commercial purpose whatsoever without prior permission in writing from the United Nations Environment Programme.

Disclaimer
The designations employed and the presentation of the material in this publication do not imply the expression of any opinion whatsoever on the part of the United Nations Environment Programme concerning the legal status of any country, territory, city or area or its authorities, or concerning delimitation of its frontiers of boundaries. Moreover, the views expressed do not necessarily represent the decision or the stated policy of the United Nations Environment Programme, nor does citing of trade names or commercial processes constitute endorsement.

අප ජීවත්වන පෘථිවිය ඔසී ඕසෝන් සහ ඔහුගේ මිතුරන් විසින් ආරක්ෂා කරනු ලබයි. පෘථිවිය මත ජීවත්වන සියළුම ජීවීන් ආරක්ෂා කිරීමට ඔසී ඕසෝන් සහ ඔහුගේ මිතුරන් නිරතුරුව ක්‍රියාකරයි.



මිනිසාගේ සෞඛ්‍ය ආරක්ෂාවට දායක වන ඕසෝන් වියන රැකගැනීමේ වැදගත්කම සමස්ත ලෝකවාසීන්ට තේරුම් කරදීමට අපේ පුංචි යාළු ඔසී ඕසෝන් සහ ඔහුගේ මිතුරන් අතීතයේ පටන් සිදු කල වික්‍රමාන්විත ක්‍රියා විශාල වශයෙන් දායක වුණා.







දූපත් රටවල් හා මුහුදු මට්ටමේ පිහිටි රාජ්‍යයන් මේ වනවිටත් මුහුදට යටවීමේ අවදානමට මුහුණ දීලා...
මේ තත්ත්වය මිනිසුන්ගේ සෞඛ්‍යයට, ආර්ථිකයට වගේම පරිසර පද්ධතීන්වලටත් දැඩි බලපෑමක් ඇති කරලයි තියෙන්නේ...
ඔසී මේ ඇහුනද......? අපි අර ධ්‍රැවාසන්න කලාපවල ඇවිදින කොට දැක්ක දේවල් ඇත්ත වේගනයි එන්නේ. අපිට වැඩි කාලයක් නෑ....
අපි දැන්ම කුඩා දූපත්වාසීන්ට උදව් කරන්න යන්න ඕනි. කෝ... ඉක්මණට ඔයාගේ පිහිනුම් ඇඳුම දාගන්න...
ඔව්.. ඔව්.. මම කැරිබියන් දූපත්වල ඉන්න මගේ දාර කැස්බෑ යාළුවා ඇලීඩාටත් කතා කරන්නම්....
දුරකතන නාමාවලිය
කැරිබියන් මුහුද
සුරිනාම්...
ආ කොහොමද ඔසී... කොහොමද සෝ....? ඔයාලා මටත් කතා කලාට ගොඩාක් ස්තුතියි... සුරිනාම්වල පිහිටි පැපගායි දිවයිනට ඔයාලව සාදරයෙන් පිළිගන්නවා. ඔබේ පැමිණීම අපට ලොකු සතුටක්..
මේ මගේ යාළු වැලි කක්කුට්ටා එයාගේ නම ගුනෝ...


ආ ඇත්තද...? හඳුනගන්න ලැබීම සතුටක්.. අපට ආරංචි වුණා දේශගුණික විපර්යාස නිසා ලෝකයේ කුඩා දූපත් සහ පහත් බිම් සහිත වෙරළාශ්‍රිත රාජ්‍යයන් මුහුදෙන් යට වෙනවා කියලා. මෙහෙ තත්ත්වෙ කොහොමද ගුනෝ...?
අනේ මේ... ඕව ගැන නම් මම දන්නේ නැහැ. වෙරළේ හදපු මගේ විසිතුරු වැලි මාළිගාව ගැන විතරයි මම දන්නේ. ඒක තමයි මං හදපු ලස්සනම මාළිගාව
ඒත්... දවසක් මං ආපහු එනකොට මාළිගාව එතන තිබුණෙ නෑ. එයාලා නම් කීවේ දේශගුණික විපර්යාස ඒක කෑවා කියලා.....
ගුනෝ එදා ඉඳන් නවත්වන්නේ නැතිව අඬනවා. අපිට මොනවා කරලාවත් ඔහුව සනසන්න බැරි වුණා.
ඒත් ඔසී... මේ පැපගායි කියන්නෙත් පහත් බිම් සහිත වෙරළාශ්‍රිත රාජ්‍යයක් නේද...?
අනේ ඔසී, මට කියන්නකෝ මේ හැමෝම කතා වෙන දේශගුණ විපර්යාසකයා කවුද කියලා... අනික ඇයි එයා මගේ මාළිගාව විනාශ කළේ...?
නෑ.... ගුනෝ
දේශගුණ විපර්යාස කියන්නේ පුද්ගලයෙක්වත් සතෙක්වත් නෙවෙයි. මේ දවස්වල වායුගෝලයට වැඩියෙන්ම එකතුවෙන හරිතාගාර වායුන් හින්දා පෘථිවියේ උෂ්ණත්වය ඉහළ යන එකට තමයි දේශගුණික විපර්යාස කියලා කියන්නේ...
මොනවද ඔය හරිතාගාර වායු කියන්නේ....?
ඒවා ඔය කාබන්ඩයොක්සයිඩ්, මීතේන් වගේ වායු වර්ග...
ඒවා කොහෙන්ද එන්නේ....?
මේ බලන්න... අපේ වායුගෝලය ස්වභාවිකවම හරිතාගාරයක් විදිහට ක්‍රියා කරනවා. ඒ හින්දා තමයි පෘථිවි පෘෂ්ඨය මේ විදියට අපිට ඉන්න පුළුවන් ස්ථාවර හා දරාගන්න පුළුවන් උෂ්ණත්වයකින් තියෙන්නේ... ඒත් අපේ විවිධ ක්‍රියාකාරකම් හින්දා හරිතාගාර වායුන් වැඩියෙන් වායුගෝලයට එන්න පටන් අරන් තියෙන නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තියෙන්නේ.... උදාහරණ විදිහට අපේ සුඛවිහරණයට යොදා ගන්නා වාහනවලට, නිවාස සීතල හරි උණුසුම් හරි කරන්න අවශ්‍ය විදුලි නිෂ්පාදනයට යොදා ගන්න පොසිල ඉන්ධන දහනය කිරීම්, වනාන්තර විනාශ කිරීම්, විශාල වශයෙන් මීතේන් මුදා හරින සත්ව ගොවිපළවල් වගේ දේවල් තමයි මේකට හේතුව.
ඒ වගේම තවත් ප්‍රබල හේතුවක් විදියට වායුගෝලයට මුදා හැරෙන උණුසුම්කාරී විභවයක් (GWP) සහිත හයිඩ්‍රොක්ලෝෆ්ලෝරෝකාබන් සහ වගේ රසායනත්, ඕසෝන් ප්‍රහීනකාරී රසායන ද්‍රව්‍යයනුත් පෙන්වා දෙන්න පුළුවන්. මේවා අපි වැඩි වශයෙන් භාවිතා කරන්නේ ශීතකරණ, වායු සමීකරණ ක්ෂේත්‍රවල වගේම සෘජුෆෝම්, මෙට්‍රස් වගේ (ෆෝම් වර්ග) නිෂ්පාදන කටයුතුවලට.
මේ විදිහට මේ රසායන වායුගෝලයට වැඩියෙන් එකතු වෙන්න ගත්තම වායුගෝලයේ උණුසුම ඉහළ යනවා. ඒ හින්දා තමයි දේශගුණ විපර්යාස ඇති වෙන්නේ...


මේ විදිහට වැඩිවෙලා තියෙන හරිතාගාර වායුවලින් ඇතිවන දේශගුණ විපර්යාස හින්දා පරිසරයට විශාල බලපෑම් එල්ල වෙලා තියෙනවා. ආහාර නිෂ්පාදනය බාල වෙලා වගේම මුහුදු මට්ටම ඉහළ යාම නිසා පහත් බිම් කලාපවල ජීවීන්ගේ ජීවන රටාව සහ භූමියේ හැඩතලත් වෙනස් වෙලා.
ඔන්න ඕක හින්දා තමයි.. සුරිනාම්වල පැපගායි දූපතේ විශාල ප්‍රමාණයක් මුහුදෙන් යටවෙන්නේ. ලෝකය පුරා ස්වභාවික විපත් වැඩිවෙන්නත්, ජීවීන් විශේෂ වඳවෙලා යන්නත්, ජනගහනයෙන් විශාල පිරිසක් අවතැන් වෙන්නත්, වසංගත රෝග වැඩිවෙන්නත් මේ තත්ත්වය හේතුවෙලා තියෙනවා...
සමහරවිට ඔයාගේ මාළිගාවට වෙන්න ඇත්තෙ ඕකම තමයි ගුනෝ. අපි මේ දැකපු මුහුදු මට්ටම ඉහළ යාම නිසා වෙන්න ඇති ඔයාගේ මාළිගාව ගිලෙන්න ඇත්තේ.
දුක්වෙන්න එපා ඇලීඩා මං මුහුද යටට කිමිදිලා බලන්නම් ගුනෝගේ මාළිගාව හොයාගෙන එන්න පුළුවන්ද කියලා... තිබුණොත් මං ඒක ආපහු ගෙනල්ලා දෙන්නම්...
ආ... රොනාල්ඩෝ මේ හරියේ ලස්සන වැලි මාළිගාවක් එහෙම තියෙනවා ඔයා දැක්කද...?
ඔව්... ඔව්... අපි මේ ටික දවසක ඉඳන් එතන තමයි ජීවත්වෙන්නේ. එන්න යමු මං ඒක පෙන්වන්නම්.


මේ මොකක්ද රොනාල්ඩෝ...?
ආ... ඕක නේද...? ඉස්සර නම් මේක ලස්සන කොරල්පරයක්.. මුහුදේ හිටපු මගෙ යාළුවෝ හුඟදෙනෙක් පදිංචි වෙලා හිටියෙ මෙතන... ළඟදි ඉඳන් මේක සුදු වෙන්න පටන් ගත්තා. දැන්නම් මේක ගලෙන් හදපු එකක් වගේ.... අපට තවදුරටත් මෙතන ජීවත් වෙන්න බැරිවුණා. ඉතින් අපට සිද්ද වුණා මාළිගාව ළඟ තැනකට යන්න...
ඕකට තමයි කියන්නේ කොරල්පර විරංජනය වෙනවා කියලා.... කොරල්පර-වලට ආහාර සහ වර්ණ ලබාදෙන ඇල්ගාවන් විනාශ වුණාම තමයි එහෙම වෙන්නේ.
ඔන්න.. මේකත් වෙන්නෙ දේශගුණ විපර්යාස හින්දා කියලා නම් මට කියන්න එපා.
මේ බලන්න... වගකීමෙන් තොර ධීවරපන්න ක්‍රම වගේම අධික ලෙස මසුන් අල්ලා ගැනීම සහ ජල දූෂණය කොරල්පර විනාශයට හේතු වෙනවා. ඒත් ලොකුම අවදානම ඇති කරන්නෙ සාගරය උණුසුම් වීම මගින්. සාමාන්‍ය ප්‍රමාණයට වඩා සාගර ජලය උණුසුම් වීම කොරල්පරවල මාරාන්තික විරංජනයට හේතු වෙනවා.
ඒ වගේම තමයි අධික කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයක් මුහුදු ජලයට උරා ගත්තම ඒ ජලය ආම්ලික වීමත් කොරල්පරවල විනාශයට හේතු වෙනවා.
ඕසෝන් වියන සිදුරුවීම නිසා පෘථිවිය මත කෙලින්ම පතිත වන අහිතකර පාරජම්බුල කිරණ නිසාත් කොරල්පර විනාශ වෙනවා...
අම්මෝ... මේ තත්ත්වෙ කොයිතරම් නරක අතට හැරිලද...?
ගිය අවුරුද්දේ කැරිබියන් මුහුදෙ උෂ්ණත්වය ඉහළ යාම හින්දා කොරල්පරවලින් සියයට අනූවකට වැඩි ප්‍රමාණයක් විනාශ වුණා. ඒ කියන්නේ දහයෙන් නවයක්ම විනාශයි. දැන් ඔයාට පේනවනේ තත්ත්වේ කොයිතරම් බරපතලද කියලා?
මේ වෙන කොට මේ තත්ත්වෙට සමාන ගැටලුවලට ලෝකය පුරා විසිරුණු දූපත් රාජ්‍යයන් පනහක් පමණ මුහුණ දීලයි ඉන්නේ.. ඒ දූපත්වල ස්වභාවික විපත් වැඩිවෙලා... දේශගුණික විපර්යාස මගින් ප්‍රශ්න තවත් උග්‍ර කරලයි තියෙන්නේ..
පේනව නේද....? ගෝලීය උණුසුම ඉහළ යාම ධ්‍රැවාසන්න ප්‍රදේශවලට බලපානවා වගේම වෙරළාසන්න ප්‍රදේශවලටත් බලපාන බව...
ගොඩාක් ප්‍රදේශ උෂ්ණත්වය වැඩිවීමේ තර්ජනයට මුහුණපාලයි ඉන්නේ...
ආ.... මේ තියෙන්නේ මාළිගාව. අපි ඒක ගුනෝට ගිහින් දෙමු...


ආ... මෙන්න ඔයාගේ මාළිගව. මං හිතනවා දැන්වත් ඔයා ඔය ඇඩිල්ල නවත්තයි... කියලා.
අහන්න ඔසී... මුහුදත් දේශගුණ විපර්යාවල තර්ජනයට ලක්වෙලයි තියෙන්නේ...අපි දැන් යමු ෆීජීවල යඳුවා ටාබා දිවයිනට. අපේ යාළු කරමල් තලගොයා ටාඕ අපි එනකන් බලන් ඉන්නවා...
අපි බලමු එහෙ තත්ත්වෙ කොහොම කියලා...
පැසිපික් සාගරය
ෆීජී
ඉතින් ටාඕ කොහොමද සැප සනීප...?
මේ බලන්න ඔසී... මං ළඟ තියෙනවා ඔයාට පෙන්නන්න දෙයක්. මේ තමයි මගේ අලුත්ම සොයා ගැනීම...
ඒ මොකක්ද ටාඕ...?
මේක........ මේ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝ කාබන් (HCFC) අණුවක්....
වායුගෝලයට නිදහස් වෙන්න කලින් මං ඒක අල්ලගත්තා....
ඔයා අතේ තියෙන මේ රසායන ද්‍රව්‍ය තමයි ක්ලොරෝෆෝලොරෝකාබන් CFC) වෙනුවට භාවිතා කරන්නේ...
ඒත් මේකත් ඕසෝන් වියනට හානි කරනවා...


කොහොම වුණත් හයිඩ්‍රොක්ලෝෆ්ලෝරෝකාබන් (HCFC) වර්ග ක්ලෝරෝෆෝලෝරෝකාබන් (CFC) තරම් ඕසෝන් වියනට හානි කරන්නේ නෑ... ඒත් ලොකුම ප්‍රශ්නෙ තමයි මේවා දේශගුණික විපර්යාස ඇති කරන එක... මේ රසායනවලින් වෙන හානිය කාබන්ඩයොක්සයිඩ්වලින් වෙන හානිය වගේ දෙදහස් ගුණයකටත් වඩා වැඩියි
ඒ කියන්නෙ (CFC) වෙනුවට (HCFC) භාවිතා කරන එක හරිම භයානකයිනෙ.
ඔව්, මිනිස්සු මේ කරන දේ ඕසෝන් වියනට හොඳ වුණාට දේශගුණ විපර්යාසවලට දායක වෙනවා.
ඒක තමයි. ඔයා මේ අණුවට කියන්න තවදුරටත් අපේ පරිසරයට හානි කරන්න එපා කියලා...
මේක වායුගෝලයට නිදහස් නොවෙන්න අපි වග බලා ගන්න ඕනි....
ඒත් මේ වෙනකොට ලෝකයේ හැමතැනකින්ම HCFC වායුගෝලයට මුදා හරිනවා. දවසින් දවස මේ තත්ත්වය වැඩිවෙනවා මිසක් අඩුවක් නම් පේන්නේ නෑ.
නමුත් මොන්ට්‍රියල් සන්ධානයේ පාර්ශ්වකාර රටවලට ස්තුතිවන්ත වෙන්න ඕනි... ඒ අය තීරණය කරලා තියෙනවා HCFC භාවිතයෙන් ඉවත් වෙන්න.
අපි දැන් යමු ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියලා හඳුන්වන ශ්‍රී ලංකාවට...අපේ යාළු අළු කොකා බටිති වගේම ගෙඹී යාළුවා බක බකස් එහේ ඉන්නවා... මොනවද කරන්නේ ඕනේ කියලා එයාලා අපිට කියයි.
ශ්‍රී ලංකාව
ඉන්දියන් සාගරය
ආ බටිති, ආ බක බකස් කොහොමද සැප සනීප...? අපි මේ ඔයාලව බලන්නයි ආවේ.


අපි මේ දවස්වල HCFC වායුගෝලයට නිදහස් වෙන එක නවත්වන්න විශේෂ මෙහෙයුමක් දියත් කරලයි තියෙන්නේ...
මේ වෙනකොට HCFC වෙනුවට භාවිතා කරන රසායන ද්‍රව්‍ය දේශගුණික විපර්යාස ඇතිකරන්න වගේම ඕසෝන් වියනට හානිකරන්න හේතු නොවන බව අපි තහවුරු කරගන්න ඕනි.
ඇත්තටම අපට ඒක කරන්න පුළුවන් වෙයිද? අපට පුළුවන්ද මේ දේශගුණ විපර්යාස නවත්වන්න.
ඔව් අපට පුළුවන්.....
මේ දේශගුණ විපර්යාස කියන්නේ ලෝකේ හැම රටකටම බලපාන ප්‍රශ්නයක්... මේ තත්ත්වේ වෙනස් කරන ශක්තිය අප සතුව තියෙනවා.
මේ කතා කර කර ඉඳල වැඩක් නෑ. අපි දේශගුණික විපර්යාස පාලනය කරන්න ඕනේ...

ලෝකයේ ගොඩක් රටවල් මේ වන විටත් දේශගුණ විපර්යාසවලට විසඳුම් සොයන්න කටයුතු කරනවා. මේ සඳහා 1992 ජුනි මාසයේදී ඇතිකරගත්ත එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියට ලෝකයේ රටවල් 154ක්ම අත්සන් කරලයි තියෙන්නේ. වායුගෝලයේ පවතින හරිතාගාර වායුන්ගේ ප්‍රමාණය අඩු කරන්න කටයුතු කිරීම වෙනුවෙන් තම රටේ දායකත්වය ලබා දෙන්න ඔවුන් මේ සම්මුතිය හරහා එකඟතාව පළ කරලා තියෙනවා.







දේශගුණ විපර්යාස නිසා වර්තමාන මෙන්ම අනාගත ලෝකයට එල්ලවිය හැකි බලපෑම් සහ අභියෝගයන්ට සාර්ථකව මුහුණදීම සඳහා ලෝකයේ මිනිසුන් සූදානම් කිරීම සඳහා මෙම සම්මුතිය ක්‍රියාත්මක වෙනවා. ඒ වගේම තමයි ලෝකය තුළ ජීවීන්ගේ පැවැත්මට සුදුසු පරිසරයක් නිර්මාණය වෙනුවෙන් කැප වී කටයුතු කිරීමත් මෙහි අරමුණක්...



## දේශගුණ විපර්යාස අවම කිරීමටත්, ඕසෝන් වියන ක්‍ෂයවීම වැළැක්වීමටත් ඔබ හා ඔබේ පවුලේ අයට කල හැකි දෑ.

(කරුණාකර මෙම සෑම ක්‍රියාකාරකමක් පිළිබඳවම ඔබේ දෙමව්පියන් සමඟ සාකච්ඡා කර ඒවා ක්‍රියාත්මක කිරීමට සුදුසුම ආකාරය හඳුනා ගන්න.)

**ගසක් සිටුවන්න.**

වායුගෝලයේ ඇති කාබන්ඩයොක්සයිඩ් උරා ගැනීම සඳහා ශාකවලින් විශාල දායකත්වයක් ලැබෙයි. වැඩි විස්තර සඳහා පිවිසෙන්න. WWW.UNEP.ORG/BILLIONTREECAMPAIGN සහ බක බකස් ගෙඹි යාළුවාගේ රුක් රෝපණය කිරීමේ ව්‍යාපෘතිය HTTP://ENO.JOENSUU.FI/CAMPAIGNS/2008.HTM

**කසළ ප්‍රතිචක්‍රීකරණය නිවසින් ආරම්භ කරන්න.**

තමාගේ නිවසේ එකතු වන කසළ නිවසේදීම ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රමවේදයක් සකසන්න. මේ සඳහා දෙම්පියන්ගේ සහාය ලබා ගන්න. කසළ, කඩදාසි, වීදුරු, ප්ලාස්ටික්, ලෝහ සහ කාබනික කසළ ලෙස වර්ග කරන්න. හැකි නම් කාබනික කසළවලින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන්න. එමගින් ස්වභාවික සම්පත් ඉතිරි කර ගත හැකිය.

**ඕසෝන් ක්‍ෂයකාරක ද්‍රව්‍ය භාවිතයෙන් තුරන් කරන්න.**

ඉසිනකාරක භාවිතයෙන් වළකින්න. ඔබ මිලදී ගන්නා නිෂ්පාදනයන්හි ලේබල් පරීක්‍ෂා කර ඒවා ඕසෝන් හිතකාමී සහ පරිසර හිතකාමී ඒවා බවට තහවුරු කර ගන්න. ඔබේ නිවසට, පාසලට නව ශීතකරණයක් හෝ වායු සමීකරණයක් මිලදී ගන්නා විට ඕසෝන් වියනට හෝ පරිසරයට හානි නොකරන රසායන ද්‍රව්‍ය අඩංගු නිෂ්පාදනයක් මිලදී ගැනීමට සෑමවිටම උත්සාහ කරන්න.

**බලශක්තිය ඉතිරි කරන විදුලි බල්බ පාවිච්චි කරන්න.**

සෑමවිටම අනවශ්‍ය විදුලි පහන් නිවා දමන්න. බලශක්තිය ඉතිරි කරන විදුලි බල්බ මිලදී ගන්නා ලෙසින් (CFL LED වැනි) ඔබේ දෙමව්පියන්ගෙන් ඉල්ලන්න. මෙම සරල ක්‍රියාමාගී විශාල පරිමාණයෙන් බලශක්තිය ඉතිරි කිරීමට දායක වන අතර, කාබන්ඩයොක්සයිඩ් විමෝචනයද අවම කරයි. භාවිතා කරන ලද බල්බ ඉවත්කිරීමේදී සමහර ඒවායේ රසදිය අන්තර්ගත වන බැවින් ප්‍රතිචක්‍රීකරණය කිරීමට මතක තබා ගන්න.

**වායුසමීකරණ සහ තාපකය (Heater) භාවිතා නොකරන අවස්ථාවල ඒවා විසන්ධි කර තැබීමට වග බලා ගන්න.**

මෙම සරළ ක්‍රියාමාගී මගින් ඔබට බලශක්තිය හා ඔබේ නිවසේ විදුලි බිල අඩු කර ගැනීමටද හැකියාව ලැබෙනු ඇත.

**අනවශ්‍ය ලෙස ඇසුරුම් භාවිතය හා ප්ලාස්ටික් ගමන් මලු භාවිතයෙන් වළකින්න.**

භාණ්ඩ මිලදී ගැනීමේදී ඇසුරුම් වැඩි ප්‍රමාණයක්, සහිත නිෂ්පාදනයන් මිලදී ගැනීමෙන් වළකින්න.
සාප්පු සවාරි යනවිට පරිසර හිතකාමී බෑගයක් රැගෙන යන ලෙස, ඔබේ දෙමව්පියන්ගෙන් ඉල්ලන්න.
මෙමගින් ප්ලාස්ටික් හා පොලිතින් බෑග් භාවිතයෙන් වැළකීමට ඔබට හැකිය.
ඒ අනුව ඔබ විසින් පරිසරයට බැහැර කරන කසළ ප්‍රමාණය අවම කරගත හැකි අතර,
කාබන්ඩයොක්සයිඩ් විමෝචනයද අවම කළ හැකිය.

**උණුසුම් ජලය භාවිතය අඩු කරන්න.**

ජලය උණු කිරීම සඳහා බලශක්තිය විශාල ප්‍රමාණයක් වැයවේ.
ඒ නිසා උණුසුම් ජල පරිභෝජනය අවම
කිරීම සඳහා නාන කාමරවලට අඩු වේගයෙන් වතුර වැස්සෙන වතුරමල් සවි කරන්න.
රෙදි සේදීමේදී සිසිල් හෝ මඳ උණුසුම් ජලය භාවිතා කරන්න.
මෙමගින් ඔබේ නිවසේ විදුලිය ගෑස් භාවිතය අවම කරගත හැකිය.

**නැවත ආරෝපණය කල හැකි බැටරි මිලදී ගන්න.**

බැටරිවල රසදිය, කැඩ්මියම් වැනි බැර ලෝහ අන්තර්ගත වේ.
මේවා පරිසර දූෂණයේ ප්‍රධාන මූලාශ්‍ර ලෙස හැඳින්විය හැකිය.
නැවත අරෝපණය කල හැකි බැටරි භාවිතා කිරීම මගින්
පරිසරය සහ ඔබේ පවුල ආරක්ෂා කර ගැනීමට ඔබට පුළුවන.
මෙම බැටරිවල ජීව කාලය නිමාවූ විට
ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීමට වන බලා ගන්න.

**විදුලි උපකරණ භාවිතා නොකරන අවස්ථාවලදී විසන්ධි කර තබන්න.**

රූපවාහිනිය වැනි විද්‍යුත් උපාංග භාවිතා නොකරන විට
ඒවා පේනුවෙන්ම විසන්ධි කර තැබීම වැදගත් වේ. (Avoid stand by mode)
මෙමගින්ද වාර්ෂිකව ශක්තිය විශාල ප්‍රමාණයක් ඉතිරි කිරීමට හැකිය.

**පාපැදිය භාවිතා කරන්න.**

මෝටර් රථය වෙනුවට පාපැදිය භාවිතා කල හැකි ගමනාන්ත
වෙනුවෙන් පාපැදිය පාවිච්චි කරන්න.
මේ නිසා ශරීරයට අවශ්‍ය ව්‍යායාමද ලැබී ඔබ නිරෝගී වනු ඇත.

**ඔබේ ප්‍රදේශයේ ස්වභාවික ආපදා පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිය පිළිබඳ දැනුවත් වන්න.**

දෙමව්පියන්, ගුරුවරුන්, පළාත් පාලන ආයතන සමඟ කතා කරමින් ඔබේ ප්‍රදේශයේ දැනට පවතින
ස්වභාවික ආපදා පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිය පිළිබඳ
දැනුවත් වන්න. එම තොරතුරු ඔබේ හිතවතුන් සමඟ බෙදා හදා ගන්න.

**ලෝකයටම කියන්න.**

වෙනසක් කිරීමේ පූර්වගාමියෙකු බවට පත්වීමට
ඔබටත් හැකිය. මෙම දැනුම බෙදා හදා ගන්න.
මේ පිළිබඳ ප්‍රවෘත්ති ප්‍රචාරය කරන්න.
එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා
අධ්‍යාපනය පිළිබඳ දශකය ප්‍රවර්ධනය කරන්න.


නියමයි...!
අපට කොයිතරම් දේවල් කරන්න පුළුවන්ද? ඕසෝන් වියන සුරැකීමේ වැදගත්කම ගැන යාළුවොත් එක්ක එකතුවෙලා ලෝකෙම දැනුවත් කරන්න අපට පුළුවන්....
ඒ වගේම තමයි දේශගුණ විපර්යාස අවම කිරීම වෙනුවෙන් අපේ එදිනෙදා ජීවිතයේදී කල හැකි දේ ගැන කියලා දෙන්නත් අපට පුළුවන්...
අපි හැමෝටම පුළුවන් වෙනසක් කරන්න. මේ පණිවිඩය ලෝකේ පුරාම අරන් යමු. අපි බලාපොරොත්තු වෙනවා මුළු ලෝකයේම දරුවන් මේ පණිවිඩය ඔවුන්ගේ පවුලේ අය සහ මිතුරන් අතර ගෙන යාවි කියලා
ඒ මොකද කියනවා නම්....

මේ වෙනුවෙන් අපප කරන හැම ක්‍රියාවක්ම වැදගත්...!!

# ඔබ ඕසෝන් සුරකින්න,
# ඕසෝන් ඔබව සුරකිනු ඇත.



**ජාතික ඕසෝන් ඒකකය**

**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

ශ්‍රී ලාංකීය දූදරුවන්ගේ දැනුම හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය විසින්
2015 සැප්තැම්බර් 16 වන දිනට යෙදෙන ජාත්‍යන්තර ඕසෝන් දිනය සැමරීම නිමිත්තෙන්
මෙම පොත මුද්‍රණය කර බෙදා හරින ලදී.